# 11 ශ්‍රේණිය

| සතිය | ශ්‍රේණිය | නිපුණතාව | පාඩම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | 10 ශ්‍රේණිය | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 9 සබඳතා රකින මිනිස් යුතුකම් | • සදිසාවෙන් දැක්වෙන යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.<br>• තම යුතුකම් ඉටුකිරීමට සැලකිලිමත් වෙයි.<br>• සදිසාවන්හි දැක්වෙන යුතුකම් "ඊ" සටහනකින් නිරූපණය කරයි.<br>• සමාජ සබඳතාවල දී සහකම්පනයෙන් කටයුතු කරයි.<br>• යහපත් සමාජ සබඳතා ගොඩනගා ගනියි. | සදිසා නමස්කාරය (සිගාලෝවාද සූත්‍රය) | 2 |
| 2 | | බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගතකරයි. | 12 කර්මය සහ එහි ප්‍රභේද හැඳිනගනිමු. | • කර්මය, කර්මයේ ප්‍රභේද හා එහි විපාක සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>• කර්මය දෙලොවදීම විපාක දෙන බව පිළිගනයි.<br>• කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වයි.<br>• කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේදී හොඳ නරක පිළිබඳ සැලකිලිමත් වෙයි. | කර්මය, කර්මයේ ප්‍රභේද හා කර්ම විපාක | 2 |
| 3 | | | 13 ඇති තතු කියන තිලකුණු දහම | • ත්‍රිලක්ෂණ ධර්මතාව පැහැදිලි කරයි.<br>• ත්‍රිලක්ෂණය ලොව පවතින සියලු ධර්මතාවලට පොදු වූවක් බව පිළිගනියි.<br>• වෙනස්වීම හැඳින ඊට අනුගතව කටයුතු කරයි. | ත්‍රිලක්ෂණය | 2 |
| 4 | | බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 15 සිව්සස් හැඳින සැනසුම ලබමු | • පටිච්ච සමුප්පාද න්‍යාය දැක්වෙන මූල සූත්‍රයේ අදහස පැහැදිලි කරයි.<br>• සියල්ල හේතුඵල සම්බන්ධතාවෙන් හටගන්නා බව පිළිගනියි.<br>• ගැටලු නිරාකරණයේ දී එහි හේතුඵල සම්බන්ධතාව සොයා බලයි.<br>• පොදු ගැටලු අධ්‍යයනය කොට අන් අයට නිවැරදි ව මග පෙන්වයි. | පටිච්චසමුප්පාද මූල සූත්‍රය '' ඉමස්මිං සති ඉදං හෝති'' පාඨය සහ '' යෙ ධම්මා හේතුප්පභවා'' ගාථා | 2 |
| 5 | | ජීව අජීවි පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 16 බුදු සිරිතයි පරිසරයයි | • බුදු සිරිත හා සම්බන්ධ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා ගෙනහැර දක්වයි.<br>• ජීවී පැවැත්මට ස්වාභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය අගය කරයි.<br>• තම පරිසරය ප්‍රසන්නව පවත්වා ගනියි. | බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | • පරිසරය සංරක්ෂණයෙහි යෙදෙයි. | | |
| 6 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 19 සසුන සුරැකි සංගායනා | • අලුවිහාර ධර්ම සංගායනාව හා කනිෂ්ක ධර්ම සංගායනාවේ වැදගත්කම විස්තර කරයි.<br>• සංගායනා ශාසන චිරස්ථිතියට හේතු වූ බව පිළිගනියි.<br>• එම සංගායනා දෙක සංසන්දනය කරමින් ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි. | මාතලේ අලුවිහාර සංගායනාව, කනිෂ්ක සංගායනාව | 2 |
| 7 | | | 20 හෙළ කලාවන් සුරකිමු. | • ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ කලා නිර්මාණ මොනවාදැයි පැහැදිලි කරයි.<br>• කලා ශිල්ප සංරක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ගෘහ නිර්මාණ, චිත්‍ර කැටයම්වලට අදාළ නිර්මාණ වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.<br>• අතීත උරුමයන් අගයමින් ආරක්ෂා කරයි.<br>• පෞරාණික ස්ථාන නැරඹීමේ දී ඒවායේ පෞරාණිකත්වයට හානි නොවන සේ කටයුතු කරයි. | ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චෛතියඝර, වාහල්කඩ, පියගැට පෙළ මුරගල, කොරවක්ගල, සඳකඩපහණ, බෝධිඝර අනුරාධපුර, පොළොන්නරු චිත්‍ර | 2 |
| 8 | | බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 22 රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • රාජ්‍ය පාලනයට උපයෝගි කරගත හැකි බෞද්ධ ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• ධාර්මිකත්වය පදනම් කොට බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සකස් වී ඇති බව පිළිගනියි.<br>• වගකීමෙන් හා වගවීමෙන් යුතු ව කටයුතු කරයි.<br>• නීති ගරුක ව ජීවත් වේ. | දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීම | 2 |
| 9 | 11 ශ්‍රේණිය | ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | 3 බුදුකුරු දම් පුරා - දිවිමග ගනිමු සපුරා | • බුද්ධ කාරක ධර්ම අරුත් සහිත ව අනුපිළිවෙළින් දක්වයි.<br>• බෝධිසත්ත්ව ජීවිතයකට බුද්ධ කාරක ධර්ම උපකාරී වන බැව් පිළිගනියි.<br>• බෝසත් දිවියකට හුරු වෙයි.<br>• යහපත් අරමුණක් ඉටුකර ගැනීම සඳහා ප්‍රතිපත්ති පූරණයෙහි යෙදෙයි. | දස පාරමිතා | 2 |
| 10 | | | 4 සමාධිගත සිතක මහිම | • සමථ හා විපස්සනා භාවනා පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරයි.<br>• භාවනාවෙන් ලැබෙන චිත්ත ඒකාග්‍රතාව ලෞකික, ලෝකෝත්තර දියුණුවට බලපාන බව පිළිගනියි. | සමථ භාවනාවේ ප්‍රභේද, භාවනාවේ ප්‍රයෝජන, චිත්ත ඒකග්‍රතාව, මෙත්තානිසංස, | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | • "භාවනාවේ ප්‍රයෝජන" යන මැයෙන් උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.<br>• තෝරාගත් භාවනාවක දෛනිකව යෙදෙයි. | සෞඛ්‍යය, නිර්වාණාවබෝධ | |
| 11 | | | 6 දිවි මගට එළිය දෙන දහම් පද | • ධම්ම පදය පිළිබඳ මූලික හැඳින්වීමක් කරයි.<br>• ධම්ම පද උපදේශ ඇසුරින් ආදර්ශවත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• ධම්ම පදයේ උපදේශ අනුගමනය කරයි. | හය ශ්‍රේණියේ සිට දහය ශ්‍රේණිය තෙක් නිර්දිෂ්ට ගාථා සමෝධානය | 2 |
| 12 | | බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | 7 සීලය හා භෞතික සංවර්ධනය | • සීලය හා එහි ප්‍රභේද සමාලෝචනය කරයි.<br>• සිල්වත් වීමෙන් පුද්ගල සමාජ හා භෞතික සංවර්ධනය අත්පත් කර ගත හැකි බව පෙන්වා දෙයි.<br>• සීලයේ ප්‍රභේද ඊ සටහනක දක්වයි.<br>• විනය ගරුකව කටයුතු කරයි. | සීලයේ ප්‍රභේද ඇසුරින් පුද්ගල හා සමාජ සංවිධානය, භෞතික සම්පත් පරිහරණ | 2 |
| 13 | | | 8 දියුණුවේ හා පිරිහීමේ දොරටු | • ව්‍යග්ඝපජ්ජ, මහා මංගල, පරාභව යන සූත්‍රවල ඇතුළත් මෙලොව දියුණුවට හේතු වන කරුණු ඉදිරිපත් කරයි.<br>• අදාළ සූත්‍ර ධර්ම ඇසුරින් මෙලොව ජීවිතය සාර්ථකව ගත කළ හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• ජීවිතයට යහපත් දේ එකතු කර ගනියි<br>• අර්ථවත් ජීවිතයක් ගත කරයි. | ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, මහා මංගල සූත්‍රය, පරාභව සූත්‍රය | 2 |
| 14 | | බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | 11 පුද්ගල විසමතා සහ කර්මය | • කර්මය සහ පුනර්භවය අර්ථ දක්වයි.<br>• කර්මය සහ පුනර්භවය අතර මනා සබඳතාවක් ඇති බැව් පිළිගනියි.<br>• චුල්ල කම්ම විභංග සූත්‍රය ඇසුරෙන් පුද්ගල විවිධත්වයට හේතු වන කරුණු වගුගත කරයි.<br>• ශිෂ්‍යයෙකු ලෙස යහපත් චර්යා රටා ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි.<br>• කර්මානුරූපීව එල විපාක ලැබෙන බව දැන සදාචාරවත් ජීවිතයක් ගත කරයි. | කර්මය හා පුනර්භවය (ප්‍රායෝගික නිදසුන්) නිබ්බේධික සූත්‍රය | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | | | 12 සසර දුකත් දුකින් මිදීමත් උගන්වන බෞද්ධ හේතුඵල ධර්මය | ● ද්වාදසාංග පටිච්ච සමුප්පාදය පැහැදිලි කරයි.<br>● සෑම සංසිද්ධියක්ම හේතුඵල සබඳතාව අනුව සිදුවන බව පිළිගනියි.<br>● ද්වාදසාංග පටිච්ච සමුප්පාදය අනුලෝමව හා ප්‍රතිලෝමව ලියා දක්වයි.<br>● සිසු ජීවිතයේ ජය ගැනීම් සඳහා ප්‍රතීත්‍ය සමුප්පාද න්‍යාය යොදා ගනියි.<br>● සමාජ ජීවිතයේ දී හමුවන ගැටලු බුද්ධිමත්ව නිරාකරණය කර ගනියි. | ද්වාදසාංගය (අනුලෝම ව හා ප්‍රතිලෝම ව දැක්වීම) | 2 |
| 16 | | ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 14 පරිසර හිතකාමී වෙමු | ● ජීවී අජීවී පරිසරය පිළිබඳ ව බෞද්ධ ඉගැන්වීම් ගෙනහැර දක්වයි.<br>● පරිසරයට හිතකාමීව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>● ජීව අජීවී පරිසර සුරක්ෂිත කිරීමට සැලසුම් කරයි.<br>● පරිසර හිතකාමී ලෙස ගෙවතු පරිසරය සකස් කරයි. | පරිසරය හා සම්බන්ධ බෞද්ධ ඉගැන්වීම්, වනරෝප සූත්‍රය | 2 |
| 17 | | ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 16 නිමල දහම රැකුණු අයුරු | ● බෞද්ධ ථෙරවාදී සංගායනා අධ්‍යයනය කරයි.<br>● බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බැව් පිළිගනියි.<br>● පළමු, දෙවන, තෙවන සහ මාතලේ අලුවිහාර සංගායනාවල වැදගත් කරුණු වගුගත කරයි.<br>● ගැටලු සහගත අවස්ථා සාකච්ඡා මගින් විසඳා ගනියි.<br>● බුදු දහමේ චිරස්ථිතිය උදෙසා කටයුතු කරයි. | පළමු, දෙවන, තෙවන හා මාතලේ අලුවිහාර සංගායනා සංක්ෂිප්තව | 2 |
| 18 | | | 18 හෙළ බොදු කලාවේ අසිරිය | ● ශාසන ඉතිහාසයෙන් උරුම වූ චිත්‍ර සහ මූර්තිවලට නිදසුන් සපයයි.<br>● මෙම දායාද සංරක්ෂණය කර ගත යුතු බව පෙන්වා දෙයි.<br>● මුද්‍රා, ආසන සහ මහනුවර යුගයේ හා නූතන යුගයේ චිත්‍ර රූප සටහන් මගින් නිරූපනය කරයි.<br>● ශාසනික කලා උරුම සංරක්ෂණය කරයි. | ප්‍රතිමා වර්ග, ආසන, මුද්‍රා, ප්‍රතිමාංසර, මහනුවර හා නූතන යුගයේ චිත්‍ර | 2 |
| 19 | | බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය | 20 දැහැමි ධනය ගෙනෙයි සැපය | ● චතුර්විධ සැපය හා ධාර්මික ධනෝපායනය කුමක්දැයි පැහැදිලි කරයි.<br>● ධනය ඉපයීම ධාර්මිකව කළයුතු බව පෙන්වා දෙයි. | චතුර්විධ සැප ධාර්මික ධනෝපායනය | 2 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | හැඳිනගෙන ඒ අනුව ක්‍රියා කරයි. | | • ''ධාර්මිකව ධනය ඉපයීමේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ ලිපියක් ලියයි.<br>• ශ්‍රමාභිමානීව කටයුතු කරයි. | | |
| 20 | | | 22 පාලකයන්ට මග කියන බුදු දහම | • බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පැහැදිලි කරයි.<br>• දසරාජ ධර්ම, සිව් බඹ විහරණ, පංච සීල ප්‍රතිපත්තිය ලැයිස්තු ගත කරයි.<br>• නිවැරදි නායකත්වයට ගරු කරයි.<br>• දෛනික ක්‍රියාකාරකම්හි දී නායකත්ව ලක්ෂණ පෙන්වයි. | දසරාජ ධර්ම පංච ශීල ප්‍රතිපත්තිය, සිව් බඹ විහරණ | 2 |